AL/2025/74/STE-I

003265

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

පාලි I
பாளி I
Pali I

**74 STE I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ❋ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❋ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ❋ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ❋ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** වර්ගාන්තාක්ෂර දෙකක් ඇතුළත් පදයක් සහිත වරණය තෝරන්න.
(1) පණ්ඩිතා (2) දමයන්ති (3) සත්ථුනො (4) වචීපරමො

**2.** **දුස්සෙහච්ඡාදයිං** යන්නෙහි නිවැරදි විසන්ධිය සහිත වරණය තෝරන්න.
(1) දුස්සෙ + ඡාදයිං (2) දුස්සෙ + අච්ඡාදයිං
(3) දුස්සෙහි + ඡාදයිං (4) දුස්සෙහි + අච්ඡාදයිං

**3.** **තිමණ්ඩලං** යන්න අයත් වන සමාසය කුමක් ද?
(1) කම්මධාරය (2) ද්වන්ද (3) දිගු (4) බහුබ්බීහි

**4.** පාලි භාෂාවට අනුව අකාරාදි පිළිවෙළට පද දක්වා ඇති වරණය තෝරන්න.
(1) ආළි, ඵල, ගාම, පුත්ත (2) ඛෙම, ගජ, දක්ඛ, සුක්ක
(3) රථ, පඤ්ච, වත, ඉතර (4) වලය, ජන, පාප, රට්ඨ

**5.** 'පාළිමත්තං ඉධානීතං නත්ථි අට්ඨකථා ඉධ' යන්නෙහි **පාළිමත්ත** යන්නෙන් අදහස් වන්නේ කවරක් ද?
(1) ත්‍රිපිටකය (2) පාලි භාෂාව (3) අභිධම්ම මාතිකා (4) සීහළට්ඨකථා

**6.** කති බ්‍යඤ්ජනානි පාලිභාසායං?
(1) අට්ඨ (2) පඤ්චවීසති (3) තෙත්තිංසති (4) එකචත්තාළීසති

**7.** කෙ දාරුකම්මානි කරොන්ති?
(1) උසුකාරා (2) තච්ඡකා (3) නෙත්තිකා (4) පණ්ඩිතා

**8.** කො මුටසීවො නාම?
(1) දෙවානම්පියතිස්සරඤ්ඤො භාතා (2) සුවණ්ණපාලී නාම දෙවියා පුත්තො
(3) අසොකරඤ්ඤො භාගිනෙය්‍යො (4) ලංකායං පඨමො නරිස්සරො

**9.** 'කථාවත්ථුප්පකරණය රචනා වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ ... පසුව ය' මෙහි හිස්තැනට අදාළ සංඛ්‍යාව කුමක් ද?
(1) සියයකට (2) එකසිය විස්සකට (3) දෙසිය දහඅටකට (4) තුන්සිය තිස් හයකට

**10.** **සමීරති** යන්නෙහි ධාතුප්‍රත්‍යය නිවැරදිව වෙන්කොට ඇති වරණය තෝරන්න.
(1) සං + ඊර + ති (2) සං + ඊ + රති (3) සම් + ඊර + ති (4) සම + ඊ + රති

**11.** සිඟාල සූත්‍රයට අනුව සතර කර්ම ක්ලේශයන්ගෙන් මිදුණු පැහැත්තා වැළකෙන පාපකර්ම සංඛ්‍යාව කෙතෙක් ද?
(1) හයකි. (2) දොළොසකි. (3) දාහතරකි. (4) දහසයකි.

[අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

0404000188113265

12. පහත සඳහන් ග්‍රන්ථ අතරින් ගද්‍ය කාව්‍යයක් වන්නේ කුමක් ද?
(1) මහාබොධිවංස (2) දාඨාවංස (3) ජිනවංසදීප (4) දීපවංස

13. අපදානපාළියෙහි එන වක්කලිත්ථෙරාපදානය අයත් වග්ගය තෝරන්න.
(1) මහාකච්චානවග්ග (2) තිණදායකවග්ග (3) භද්දියවග්ග (4) ඵලදායකවග්ග

14. බුදුවරුන්ගේ චරිත අනාවරණය කෙරෙන ඛුද්දකනිකායාගත ග්‍රන්ථ දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) උදානපාළි සහ අපදානපාළි (2) බුද්ධවංසපාළි සහ නිද්දෙසපාළි
(3) අපදානපාළි සහ බුද්ධවංසපාළි (4) චරියාපිටකපාළි සහ උදානපාළි

15. **'මගේ'** සහ **'අපගේ'** යන අරුත් පමණක් දෙන පාලි පද ඇතුළත් වරණය කුමක් ද?
(1) මෙ, මයි, අම්හෙ, අම්හාකං (2) තව, මම, තුම්හං, තුම්හාකං
(3) මය්හං, මමං, තුය්හං, තවං (4) මම, මය්හං, අම්හං, අම්හාකං

16. පහත දැක්වෙන ඒවායින් ටීකාවක් රචනා කොට ඇත්තේ කවර ග්‍රන්ථයට ද?
(1) මහාකස්සපචරිත (2) රසවාහිනී
(3) සහස්සවත්ථුප්පකරණ (4) සීහළවත්ථුප්පකරණ

17. **'සුඛමසයිත්ථ මහාරාජ'** මෙම උද්ධෘතය මගින් ප්‍රකාශ වන්නේ,
(1) අතීත කාලයට සම්බන්ධ අදහසකි. (2) වර්තමානයේ සිදුවෙමින් පවතින්නකි.
(3) අනාගතයෙහි සිදුවීමට නියමිත වූවකි. (4) කාලයක් ප්‍රකාශ නොවන විධානයකි.

18. පාලි භාෂාව අනුරාධපුර මහාවිහාරීය භික්ෂූන්ගේ නිපදවීමක් බව දක්වන ලද්දේ කවුරුන් විසින් ද?
(1) සී.එච්.ඉසැඩ්. වික්‍රමසිංහ (2) විල්හෙල්ම් ගෛගර්
(3) ආර්.සී. චිල්ඩර්ස් (4) ඊ.ජේ. තෝමස්

19. සිගාල සූත්‍රය දේශනා කරන විට බුදුරදුන් වැඩසිටි ආරාමය වන්නේ,
(1) කොසඹෑනුවර ඝෝසිතාරාමය යි. (2) බරණැස ඉසිපතනාරාමය යි.
(3) සැවැත්නුවර ජේතවනාරාමය යි. (4) රජගහනුවර වෙළුවනාරාමය යි.

20. දෙවන හා තෙවන ධර්ම සංගායනා පිළිබඳව සඳහන් වන පෙළ ග්‍රන්ථයක් වන්නේ,
(1) අපදානපාළිය යි. (2) අංගුත්තරනිකාය යි.
(3) කථාවත්ථුප්පකරණය යි. (4) චුල්ලවග්ගපාළිය යි.

21. **'ජලං අග්ගිව භාසති'** යන්නෙහි නිවැරදි තේරුම වන්නේ මේවායින් කුමක් ද?
(1) ජලය ගින්න මෙන් දිලිසෙයි. (2) දැල්වෙන ගින්නක් මෙන් බබළයි.
(3) ගින්න ජලය මෙන් බැසයයි. (4) ගිනි මෙන් දැවෙමින් කියයි.

22. වත්තක්ඛන්ධකයට අනුව **චීවරවංස** හා **චීවරරජ්ජු** යනු අනුපිළිවෙළින්
(1) චීවර පරම්පරාව හා සිවුරු කෙළවර ඇති නූල ය.
(2) තුන් සිවුර හා අවශේෂ ශ්‍රමණ පිරිකර ය.
(3) සිවුරු වියලන තැන හා සිවුරු බඳින රැහැන ය.
(4) සිවුරු වනන උණ ලීය හා සිවුරු දමන වැල ය.

23. පහත සඳහන් වාක්‍ය අතරින් ව්‍යාකරණමය දෝෂ සහිත වන්නේ කවරක් ද?
(1) තුම්හෙ මමාගමනං උදික්ඛන්තා මුහුත්තං නිසීදථ.
(2) සද්ධිවිහාරිකෙන භික්ඛවෙ උපජ්ඣායම්හි සම්මාවත්තිතබ්බං.
(3) අජ්ජාහං පච්චූසසමයෙ සොළස මහාසුපිනෙ පස්සිම්හ.
(4) පිතා මං භන්තෙ කාලං කරොන්තො එවං අවච.

24. උපමාවක් හා රූපකයක් ප්‍රකාශ වන වරණය තෝරන්න.
(1) භොගා සන්නිචයං යන්ති, වම්මිකො'වුපචීයති.
(2) පදුමාකාරවදනො, පදුමාමලසුච්ඡවි.
(3) නොනීතසුඛුමාලං මං, ජාතපල්ලවකොමලං.
(4) අනන්තාදීනවො කායො, විසරුක්ඛසමූපමො.

25. දෙවන ධර්ම සංගායනාවට සම්බන්ධ වූ තෙරවරුන්ගේ නම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සබ්බකාමී, ධම්මරක්ඛිත, ඉසිදත්ත, යස
(2) සම්භූත, යස, රේවත, සුමන
(3) සාළ්හ, ඛුජ්ජසෝභිත, ඉසිදත්ත, අනුරුද්ධ
(4) ඛුජ්ජසෝභිත, මහාසෝණ, රේවත, නිග්‍රෝධ

26. 'බ්‍රාහමණා පන න ධම්මසුධම්මතාය තයි සිනෙහෙන කථයිංසු' යන ප්‍රකාශය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?
(1) කොසොල් රජු විසින් මල්ලිකා දේවියට
(2) බමුණන් විසින් කොසොල් රජතුමාට
(3) බුදුරදුන් විසින් කොසොල් රජුට
(4) මල්ලිකා දේවිය විසින් බමුණු පුරෝහිතයන්ට

- පහත ගාථා ඇසුරෙන් අසා ඇති **27, 28, 29, 30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාගිනෙය්‍යං මහාරිට්ඨං, අමච්චං පමුඛං තතො,
දිජං අමච්චං ගණකං, රාජා තෙ චතුරො ජනෙ.

දූතෙ කත්වාන පාහෙසි, බලොඝපරිවාරිතෙ,
ගාහාපෙත්වා අනග්ඝානි, රතනානි ඉමානි සො.

මණිජාතී ච තිස්සො තා, තිස්සො ච රථයට්ඨියො,
සඞ්ඛඤ්ච දක්ඛිණාවත්තං, මුත්තාජාතී ච අට්ඨ තා.

27. ගාථාවන්හි සන්දර්භය අනුව **මුත්තාජාතී** යන්න අයත් වන විභක්තිය හා වචනය කුමක් ද?
(1) පඨමා ඒකවචන (2) දුතියා ඒකවචන (3) පඨමා බහුවචන (4) දුතියා බහුවචන

28. මෙහි සඳහන් දූතයන් දඹදිවට ගියේ,
(1) ආරක්ෂක භට සේනාවක් සමඟ ය.
(2) තිස්ස නම් ඇමතියා ප්‍රධාන කොට ගෙන ය.
(3) ලක්දිව වතුර වූ ජනතාවක් සමඟ ය.
(4) හතර දෙනෙකුගෙන් සමන්විත පිරිසක් වශයෙනි.

29. දෙවනපෑතිස් රජු විසින් අශෝක අධිරාජයාට යවන ලද වස්තු අට නිවැරදිව සඳහන් වන වරණය තෝරන්න.
(1) සක්ගෙඩිය, මැණික් වර්ග තුන, සැරයටි තුන, මුතු
(2) මැණික්, සැරයටි තුන, සක්ගෙඩිය, මුතු වර්ග තුන
(3) මුතු, සක්ගෙඩි, සැරයටි තුන, මැණික් වර්ග තුන
(4) මැණික් වර්ග තුන, සැරයටි දෙක, සක්ගෙඩිය, මුතු වර්ග දෙක

30. ඉහත ගාථාවන්හි සඳහන් දූත පිරිසට ඇතුළත් පුද්ගලයන් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) මහා අරිට්ඨ, බෑණා, ඇමති, බමුණා
(2) බෑණා, ගණකයා, සොහොයුරා, ප්‍රධාන ඇමති
(3) මහා අරිට්ඨ, ප්‍රධාන ඇමති, බමුණා, ගණකයා
(4) ගණකයා, ඇමති, මහා අරිට්ඨ, සොහොයුරා

31. සිගාල සූත්‍රයේ සඳහන් පරිදි මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානියක් ප්‍රකාශ වන වරණය තෝරන්න.
(1) බහූනං දුක්ඛධම්මානං පුරක්ඛතො හොති.
(2) අතිජාතොස්මීති කම්මං න කරොති.
(3) සභාගතස්ස වචනං න රූහති.
(4) පඤ්ඤාය දුබ්බලීකරණී භවති.

32. අන්‍ය භික්ෂුවක් ඉදිරියෙහි වරද ප්‍රකාශ කිරීමෙන් ශුද්ධිය ලබාගත හැකි වන්නේ පහත දැක්වෙන කවර ඇවැත් ප්‍රභේදයකින් ද?
(1) පාරාජිකාපත්ති (2) සංඝාදිසෙසාපත්ති (3) සංඝභෙදාපත්ති (4) දුක්කටාපත්ති

33. විනයට අනුව '**න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං**' යන්නෙහි නිවැරදි අර්ථය ඇතුළත් වරණය තෝරන්න.
(1) වැඩිහිටි තෙරවරුන් හා සම අසුන් ගෙන නොසිටිය යුතු ය.
(2) ස්ථවිර භික්ෂූන් අතර සිරුරෙහි ගැටෙන සේ නොහිඳිය යුතු ය.
(3) වැඩිහිටි තෙරවරුන්ට හිරිහැර වන සේ ළංව අසුන් නොපැනවිය යුතු ය.
(4) ආචාර්ය, උපාධ්‍යාය තෙරවරුන් අසුන්වලින් බැහැර නොකළ යුතු ය.

34. මහාසුපින ජාතකයට අනුව කොසොල් රජු දුටු පළමු සිහිනය වන්නේ පහත ඒවායින් කවරක් ද?
(1) කුඩා ගස් හා පඳුරු පොළොවෙන් නැගී මල් පල දැරීම
(2) යුද පිණිස ආ අඳුන් වන් ගොනුන් සතරක් එසේ නොකොට ආපසු යාම
(3) එදින ම උපන් නොමේරූ වසු පැටවුන්ගෙන් කිරි බොනු දැකීම
(4) මහත් වූ කළුගල් නැව් මෙන් ජලයෙහි පාවෙමින් තිබීම



003265

03040000188113265

35. වක්කලී තෙරුන්ගේ චරිත ලක්ෂණ වඩාත් ඉස්මතු කෙරෙන ප්‍රකාශය තෝරන්න.
(1) සද්ධාධිමුත්තො සුමතී, මම දස්සනලාලසො
(2) සබ්බවෙරවිනිම්මුත්තො, සුඛෙන පරිවඩ්ඪිතො
(3) හෙමයඤ්ඤොපවීතඞ්ගං, ජනනෙත්තමනොහරං
(4) සදෙවමනුජාකිණ්ණෙ, ජනමජ්ඣෙ අනුත්තමො

36. පාලි භාෂාවෙහි පූර්වක්‍රියා සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) පාලි භාෂාවෙහි සියලු පූර්වක්‍රියා 'ත්වා' ප්‍රත්‍යයෙන් අවසන් වේ.
(2) ත්වා වර නොනැගෙන හෙයින් නිපාත ගණයට අයත් වේ.
(3) වාක්‍යයක යෙදිය හැකි පූර්වක්‍රියා සංඛ්‍යාවේ නියමයක් නැත.
(4) 'ය, ය්හ, ම්ම' යනාදිය පූර්වක්‍රියා ප්‍රත්‍ය නොව ආදේශයන් ය.

37. ධර්මයේ අගය අවධාරණය කිරීම සඳහා වඩාත් උචිත ප්‍රකාශය තෝරන්න.
(1) කණ්හං ධම්මං විප්පහාය, සුක්කං භාවෙථ පණ්ඩිතො.
(2) යො හි පස්සති සද්ධම්මං, සො මං පස්සති පණ්ඩිතො.
(3) අරියප්පවෙදිතෙ ධම්මෙ, සදා රමති පණ්ඩිතො.
(4) අහං බුද්ධඤ්ච ධම්මඤ්ච, සඞ්ඝඤ්ච සරණංගතො.

38. '**සාවත්ථියං පුරෙ ජාතො, කුලෙ අඤ්ඤතරෙ අහං**' යන්නෙහි අන්වය වඩාත් නිවැරදිව ප්‍රකාශ වන වරණය තෝරන්න.
(1) අඤ්ඤතරෙ කුලෙ අහං සාවත්ථියං ජාතො පුරෙ.
(2) පුරෙ අහං සාවත්ථියං අඤ්ඤතරෙ කුලෙ ජාතො.
(3) පුරෙ ජාතො අහං සාවත්ථියං අඤ්ඤතරෙ කුලෙ.
(4) පුරෙ කුලෙ අඤ්ඤතරෙ අහං ජාතො සාවත්ථියං.

39. මජ්ඣිමනිකායට ඇතුළත් සූත්‍ර පමණක් දක්නට ලැබෙන්නේ කවර වරණයෙහි ද?
(1) අලගද්දූපම, උපාලි, චූල්ලකම්මවිභංග, මූලපරියාය
(2) මහාකම්මවිභංග, පරාභව, බ්‍රහ්මායු, මහාසමය
(3) ධම්මචක්කප්පවත්තන, බ්‍රහ්මජාල, වසල, ධම්මික
(4) වච්ඡගොත්ත, ගිරිමානන්ද, මධුපිණ්ඩික, දසධම්ම

40. '**භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො**' යන්නෙහි නිවැරදි කර්තෘකාරක වාක්‍යය තෝරන්න.
(1) භගවතා අනෙකපරියායො ධම්මො පකාසිතො.
(2) භගවා අනෙකපරියායං ධම්මං පකාසිතං.
(3) භගවතා අනෙකපරියායං ධම්මො පකාසයි.
(4) භගවා අනෙකපරියායෙන ධම්මං පකාසෙසි.

41. ආවාසයක් පිරිසිදු කිරීමේදී බැහැර තැබිය යුතු භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ.

A - මඤ්චං
B - පත්තචීවරං
C - භිසිබිම්බොහනං
D - නිසීදනපච්චත්ථරණං

වත්තක්ඛන්ධකය අනුව ඉහත සඳහන් භාණ්ඩ බැහැරලිය යුතු අනුපිළිවෙළ නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) A, B, C, D (2) B, D, C, A (3) C, A, B, D (4) D, C, A, B

42. බෞද්ධ සන්දර්භය තුළ සංගීති යනුවෙන් දැක්වෙන්නේ,
(1) මතකයෙන් යමක් කියන විට එකතුව අසා සිටීමට ය.
(2) කටපාඩම් දැ ගීත ස්වරයෙන් අන් අයට පුහුණු කිරීමට ය.
(3) පිරිසක් එකතුව උස් හඬින් යමක් කටපාඩම් කිරීමට ය.
(4) බොහෝ දෙනෙකු එක්වී එකවර යමක් කටපාඩමෙන් කීම ය.

'බුද්ධකරුණ්ඩානං පුප්ඵං විය' යන උපමාව වඩාත් ගැළපෙනුයේ පහත දැක්වෙන කවර වරණයට ද?
(1) නිසි වයසට නොපැමිණි දැරියන් සෘතු වීම
(2) රජවරුන් අධාර්මික කල්හි සුළඟ විෂම වීම
(3) දුසිල් පවිටු පිරිස් නිවන පිළිබඳ කථා කිරීම
(4) ලාභයට ගිජු මිනිසුන් නීතිය පසිඳලීම

44. ස්වභාව සෞන්දර්ය වර්ණනයක් සඳහා වඩාත් උචිත කාව්‍යාත්මක කියමන ඇතුළත් වන්නේ කවර වරණයෙහි ද?
(1) අනොතත්තොදකං චෙව, ගඞ්ගා සලිලමෙව ච.
(2) ගිජ්ඣකූටං සමාරුය්හ, ඣායාමි ගිරිකන්දරෙ.
(3) මුත්තාසමුද්දා උග්ගන්ත්වා, තීරෙ වට්ටි වියට්ඨිතා.
(4) සෙලො යථා එකඝනො, වාතෙන න සමීරති.

45. පහත ප්‍රකාශවලින් ශාසනික වතක් උල්ලංඝනය වන්නේ කවරකින් ද?
(1) උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා.
(2) උපජ්ඣායම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං.
(3) න උපජ්ඣායං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො.
(4) සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං.

46. ගිහිගෙයින් නික්ම පැවිදිව මානසික සුවයෙන් වාසය කිරීම ධ්වනිත වන පාලි පාඨය තෝරන්න.
(1) සබ්බභොගපරිබ්බුළ්හො, සුඛිතො සංසරිස්සති.
(2) තමහං ධම්මමඤ්ඤාය, අරහත්තමපාපුණිං.
(3) ඔකා අනොකං ආගම්ම, විවෙකෙ යත්ථ දූරමං.
(4) තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය, හිත්වා කාමෙ අකිඤ්චනො.

47. මහාසුපින ජාතකයට අනුව කොසොල් රජු දුටු සිහින අනාගතයෙහි විපාක දීමට හේතු වන ආසන්නතම කාරණය වන්නේ කවරක් ද?
(1) ආගමික නායකයන් අධාර්මික පිරිසක් වීම
(2) ජනයා දැහැමි වන විට රජවරුන් අධාර්මික වීම
(3) විවිධ ජාතීන් අතර අසමගිය ගොඩනැගීම
(4) කුසල් සිතිවිලි යටපත්ව අකුසලයට රුචි කිරීම

48. පහත දැක්වෙන්නේ විවිධ පුද්ගලයන්ගේ චරිත ලක්ෂණ කිහිපයකි,

A - පාපකම්පි අස්ස අනුජානාති.

B - ආපදාසු න විජහති.

C - සමජ්ජාභිචරණෙ සහායො හොති.

D - වණ්ණං භණමානං පසංසති.

ඉහත ප්‍රකාශ අනුව එම පුද්ගලයන් අතරින්
(1) A, B යහපත් වන අතර C, D අයහපත් වේ.
(2) A, C, D අයහපත් වන අතර B යහපත් වේ.
(3) A, C අයහපත් වන අතර B, D යහපත් වේ.
(4) B, C, D යහපත් වන අතර A අයහපත් වේ.

49. සද්ධිවිහාරික භික්ෂුව පරිවාසයට නිසි ගරු ඇවතකට පත්වූ විට උපාධ්‍යාය භික්ෂුව විසින් ගතයුතු විනයානුකූල පියවර මේවායින් කුමක් ද?
(1) එම ඇවතට පත් වූයේ කෙසේ දැයි විමසා බැලීම
(2) පළමුව අවවාද දී නිවැරදි කිරීමට උත්සාහ ගැනීම
(3) සංඝයා විසින් පිරිවෙස් දෙන තෙක් බලා සිටීම
(4) පිරිවෙස් දීම සඳහා සංඝයා උත්සාහවත් කරවීම

50. මහාසුපින ජාතකය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය මේ අතරින් කුමක් ද?
(1) බුදුරදුන් ජීවමාන අවදියේ පැවති ශාසනික අර්බුද මෙමගින් අනාවරණය වේ.
(2) බුද්ධකාලීන භාරතීය සමාජ හා දේශපාලනික තත්ත්වය පමණක් මෙයින් කියැවේ.
(3) බුදුරදුන් අනාගත ලෝකය ගැන කළ හෙළිදරව්වක් මෙයින් ප්‍රකාශිත ය.
(4) මෙබඳු සිහින අතීත රජවරුන් මෙසේ තුදුටු බව බුදුන් වහන්සේ වදාළහ.

* * *



PAST PAPERS WIKI

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

පාලි II
பாளி II
Pali II

74 STE II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

வினாத்தாளை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.

**උපදෙස්:**

* I කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, II හා III කොටස්වලින් **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සම්පූර්ණයෙන් **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතු ය.

## I කොටස

**1.** **සිංහලට** නගන්න.

(i) අනාගතස්මිං හි රාජානො අධම්මිකා භවිස්සන්ති, තෙසු අධම්මිකෙසු රාජයුත්තාපි බ්‍රාහ්මණගහපතිකාපි නෙගමජානපදාපීති සමණබ්‍රාහ්මණෙ උපාදාය සබ්බෙ මනුස්සා අධම්මිකා භවිස්සන්ති. තතො තෙසං ආරක්ඛදෙවතා බලිපටිග්ගාහිකා දෙවතා රුක්ඛදෙවතා ආකාසට්ඨදෙවතාති එවං දෙවතාපි අධම්මිකා භවිස්සන්ති. අධම්මිකරාජූනං රජ්ජෙ වාතා විසමා ඛරා වායිස්සන්ති, තෙ ආකාසට්ඨවිමානානි කම්පෙස්සන්ති, තෙසු කම්පිතෙසු දෙවතා කුපිතා දෙවං වස්සිතුං න දස්සන්ති. වස්සමානොපි සකලරට්ඨෙ එකප්පහාරෙන න වස්සිස්සති. වස්සමානොපි සබ්බත්ථ කසිකම්මස්ස වා වප්පකම්මස්ස වා උපකාරො හුත්වා න වස්සිස්සති, යථා ච රට්ඨෙ එවං ජනපදෙපි ගාමෙපි එකතළාකසරෙපි එකප්පහාරෙන න වස්සිස්සති, තළාකස්ස උපරිභාගෙ වස්සන්තො හෙට්ඨාභාගෙ න වස්සිස්සති, හෙට්ඨා වස්සන්තො උපරි න වස්සිස්සති, එකස්මිං භාගෙ සස්සං අතිවස්සෙන නාසෙස්සති, එකස්මිං අවස්සනෙන මිලාපෙස්සති, එකස්මිං සම්මා වස්සමානො සම්පාදෙස්සති.

(ජාතකට්ඨකථා)

(ii) තදාහං හංසවතියං, නගරෙ බ්‍රාහ්මණත්‍රජො,
හුත්වා සුත්වා ච තං වාක්‍යං, තං ඨානමභිරොචයිං.

සසාවකං තං විමලං, නිමන්තෙත්වා තථාගතං,
සත්තාහං භොජයිත්වාන, දුස්සෙහච්ඡාදයිං තදා.

නිපච්ච සිරසා තස්ස, අනන්තගුණසාගරෙ,
නිමුග්ගො පීතිසම්පුණ්ණො, ඉදං වචනමබ්‍රවිං.

"යො සො තයා සත්ථවිතො, ඉතො සත්තමකෙ'හනි,
භික්ඛු සද්ධාවතං අග්ගො, තාදිසො හොමහං මුනෙ."

එවං වුත්තෙ මහාවීරො, අනාවරණදස්සනො,
ඉමං වාක්‍යං උදීරෙසි, පරිසායං මහාමුනි.

(අපදානපාළි)

(ලකුණු 10 + 10 = 20)

[අනෙක් පිටුව බලන්න / மறுபக்கம் பார்க்க / Please turn over

03030000188113265

2. (i) **සිංහලට** නගන්න.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨාතබ්බා: දානෙන, පෙය්‍යවජ්ජෙන, අත්ථචරියාය, සමානත්තතාය, අවිසංවාදනතාය. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති: පමත්තං රක්ඛන්ති, පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති, භීතස්ස සරණං හොන්ති, ආපදාසු න විජහන්ති, අපරපජා චස්ස පටිපූජෙන්ති. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා උත්තරා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා. පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දාසකම්මකරා පච්චුපට්ඨාතබ්බා: යථාබලං කම්මන්තසංවිධානෙන, භත්තවෙතනානුප්පදානෙන, ගිලානුපට්ඨානෙන, අච්ඡරියානං රසානං සංවිභාගෙන, සමයෙ වොස්සග්ගෙන.

(දීඝනිකාය)

(ii) **පාලියට** නගන්න.

(අ) සැමකල්හි මාගේ පූජාවෝ නුවණැත්තන්ට වෙත්වා!

(ආ) මම සභාවේදී දැරියගේ කථාව ඇසුවෙමි.

(ඉ) අපේ පියවරු ද සහෝදරයෝ ද වෙළෙන්දෝ වෙති.

(ඊ) ධනවත්තු පුත්‍රයන් සමඟ හිමාලයට යන්නාහ.

(උ) කඩයට ගොස් වහා ගිතෙල් ගෙනෙව.

(ලකුණු 10 + 10 = 20)

## II කොටස

3. (i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති, නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා, ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. සචෙ උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං, න අච්චාසන්නෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං. න උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා. උපජ්ඣායො ආපත්තිසාමන්තා භණමානො නිවාරෙතබ්බො. නිවත්තන්තෙන පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං.

(අ) **තිමණ්ඩල** යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ආ) **පාදපීඨං, පාදකඨලිකං** යන පදවල සිංහල අර්ථය පෙන්වා දෙන්න.

(ඉ) ගමට පිවිසෙනු කැමති උපාධ්‍යායයන් වහන්සේට පිළිගැන්වියයුතු දෑ **හතරක්** සිංහල අර්ථය සමග ඡේදයෙන් උපුටා දක්වන්න.

(ඊ) පිඬු පිණිස හැසිරෙන උපාධ්‍යායයන් වහන්සේට පසුමහණෙකු වන තැනැත්තා විසින් පිළිපැදියයුතු ආකාරය ඡේදයට අනුව පහදන්න.

(ii) වරහන් තුළ දී ඇති ශබ්ද ප්‍රකෘති විභක්ති ගන්වා නිර්දිෂ්ට ග්‍රන්ථාගත පරිදි හිස්තැන් පුරවන්න.

(අ) එවං භන්තෙ'ති ඛො ................ (සිගාල) ගහපතිපුත්තො ................ (භගවන්තු) පච්චස්සොසි.

(ආ) කථං හි නාම ................ (භික්ඛු) සද්ධිවිහාරිකා ................ (උපජ්ඣාය) න සම්මාවත්තිස්සන්ති.

(ඉ) තුම්හෙ ................ (තුම්හ) කම්මං කරොථ, ................ (අම්හ) තුම්හාකං සන්තිකෙ කිං කරිස්සාමි.

(ඊ) යථාකථං පන ................ (භදන්ත) අරියස්ස විනයෙ ................ (ඡද්දිසා) නමස්සිතබ්බා?

(උ) තදා ................(බාරාණසී) බ්‍රහ්මදත්තො ඉමිනාව නියාමෙන ඉමෙ සුපිනෙ දිස්වා ................ (බ්‍රාහ්මණ) පුච්ඡි.

(ලකුණු 10 + 10 = 20)

(i) **භාණකා** හා **පොරාණා** යන වචනවලින් අදහස් වන්නේ කවර පිරිසක් ද යන්න හඳුන්වා දෙන්න.

(ii) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(අ) දීඝනිකායට හා මජ්ඣිමනිකායට අයත් සූත්‍ර ගණන අනුපිළිවෙළින් කෙතෙක් ද?

(ආ) මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් සම්පාදිත අභිධර්ම ග්‍රන්ථය කුමක් ද?

(ඉ) දීඝ හා මජ්ඣිම යන නිකාය දෙකෙහි ම දක්නට ලැබෙන සූත්‍රයක් නම් කරන්න.

(ඊ) බුද්ධත්වය ලැබූ තැන් පටන් බුද්ධචරිතය සංක්ෂිප්තව දැක්වෙන විනය පිටකාගත ග්‍රන්ථය කුමක් ද?

(උ) පාලි භාෂාව අර්ධ මාගධියෙන් සකස් කරගත් ශාස්ත්‍රීය භාෂාවක් බව ප්‍රකාශ කරන ලද්දේ කවර විද්වතෙකු විසින් ද?

(iii) පහත සඳහන් ගාථාවෙහි අර්ථය පැහැදිලි වන සේ බුද්දකනිකාය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

**ඨපෙත්වා චතුරොපෙතෙ, නිකායෙ දීඝආදිකෙ,**
**තදඤ්ඤං බුද්ධවචනං, නිකායො ඛුද්දකො මතො.**

(iv) පහත දැක්වෙන කෘතිවලින් **දෙකක** ඓතිහාසික හා ආගමික අගය අනාවරණය කරන්න.

(අ) ඡකෙසධාතුවංස (ආ) ජිනකාලමාලී

(ඉ) ථූපවංස (ඊ) රසවාහිනී

(ලකුණු 5 + 5 + 5 + 5=20)

5. (i) ධර්මාර්ථ වඩාත් අලංකාරවත් ලෙස ප්‍රකාශ කිරීමට කාව්‍යාලංකාර යොදාගෙන ඇති ආකාරය පහත දැක්වෙන පාඨ **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.

(අ) අනන්තාදීනවො කායො, විසරුක්ඛසමූපමො

(ආ) වීරො පදුමපත්තක්ඛො, කන්තො ච පදුමං යථා

(ඉ) ලොකජෙට්ඨො ච නිම්මානො, අන්ධානං නයනූපමො

(ඊ) සන්තවෙසො ගුණනිධි, කරුණාමතිසාගරො

(ii) පහත දැක්වෙන ගාථා පඞ්ක්තියෙන් නිරූපිත අවස්ථාව පිළිබඳ කාව්‍යාත්මක ඇගයීමක් කරන්න.

තාසු එකා ලතායට්ඨී, රජතාභා තහිං ලතා,
සුවණ්ණවණ්ණා රුචිරා, දිස්සන්තෙ තා මනොරමා.

එකා කුසුමයට්ඨී තු, කුසුමානි තහිං පන,
නානානි නානාවණ්ණානි, දිස්සන්තෙ'තිවුට්ඨානි ච.

එකා සකුණයට්ඨී තු, තහිං පක්ඛිමිගා බහූ,
නානා ච නානාවණ්ණා ච, සජීවා විය දිස්සරෙ.

(iii) සිගාල සූත්‍රයට අනුව A කොටසේ දැක්වෙන පුද්ගලයාට අදාළ ලක්ෂණ B කොටසින් තෝරා ලියන්න.

| | A | B |
|---|---|---|
| (අ) | වචීපරම | පරම්මුඛා'ස්ස අවණ්ණං භාසති |
| (ආ) | අත්ථක්ඛායී | භීතස්ස සරණං හොති |
| (ඉ) | අනුප්පියභාණී | අතීතෙන පටිසන්ථරති |
| (ඊ) | ආනුකම්පක | සග්ගස්ස මග්ගං අචික්ඛති |
| (උ) | උපකාර | අවණ්ණං භණමානං නිවාරෙති |

(iv) වත්තක්ඛන්ධකය තුළ කායික සෞඛ්‍යය කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඇති ආකාරය නිදසුන් මගින් සනාථ කරන්න.

(ලකුණු 5+5+5+5 =20)

003265

02030000188113265

[ අනෙක් පිටුව බලන්න/ ... /Please turn over

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## III කොටස

6. (i) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කරන්න.

(අ) අජ්ජ + අහං
(ආ) එතං + අවොච
(ඉ) පාද + උදකං
(ඊ) චිර + පභුති
(උ) ත්වම්පි + ඉමානි
(ඌ) න + අභිජානාමි
(එ) විතිච්ඡය + ඨානං
(ඒ) න + ඉධමත්ථි
(ඔ) ඉතරෙසු + එව
(ඕ) ධම්මං + අඤ්ඤාය

(ii) පහත සඳහන් ආඛ්‍යාත පදවල ධාතු පෙන්වා දෙන්න.

(අ) අකාරයි
(ආ) වත්තන්ති
(ඉ) වස්සිස්සති
(ඊ) පබ්බජිං
(උ) කථෙහි
(ඌ) නීහරති
(එ) භවිස්සති
(ඒ) අද්දසං
(ඔ) ගිලන්ති
(ඕ) ඛාදති

(iii) පහත දැක්වෙන නාම පද කවර ලිංගයකට අයත් දැයි නම් කරන්න.

(අ) සුගති
(ආ) චන්දිමා
(ඉ) භාජනං
(ඊ) යාගු
(උ) උක්ලාපො
(ඌ) චීවරං
(එ) ලඬිකා
(ඒ) සුතො
(ඔ) අමච්චා
(ඕ) කුසුමානි

(iv) පහත දැක්වෙන පද තද්ධිත, කිතක හා පූර්වක්‍රියා යන ව්‍යාකරණ ප්‍රවර්ගයන්ට අනුව වෙන් කරන්න.

(අ) දුග්ගතා
(ආ) පිවන්තා
(ඉ) ආරුය්හ
(ඊ) මෙධාවී
(උ). භණමානො
(ඌ) මාණවො
(එ) ලද්ධාන
(ඒ) රක්ඛිතො
(ඔ) වසිත්වාන
(ඕ) නියයාණිකා

(ලකුණු 5+5+5+5=20)

7. (i) ධම්මපදයේ පණ්ඩිත වග්ගයට අනුව A කොටසේ දැක්වෙන පාඨවලින් ආරම්භ වන ගාථාවල අවසාන පාදය B කොටසින් තෝරා ලියන්න.

| | A | B |
|---|---|---|
| (අ) | කණ්හං ධම්මං විප්පහාය | අත්තානං දමයන්ති පණ්ඩිතා |
| (ආ) | ධම්මපීති සුඛං සෙති | විවෙකෙ යත්ථ දූරමං |
| (ඉ) | උදකං හි නයන්ති නෙත්තිකා | භජෙථ පුරිසුත්තමෙ |
| (ඊ) | න භජෙ පාපකෙ මිත්තෙ | ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා |
| (උ) | න අත්තහෙතු න පරස්ස හෙතු | සදා රමති පණ්ඩිතො |

(ii) පහත දැක්වෙන පදවල සිංහල අර්ථය ලියන්න.

(අ) ආචමනකුම්භි
(ආ) වච්චකුටි
(ඉ) බිම්බොහන
(ඊ) අපස්සෙනඵලක
(උ) කවාටපිට්ඨ
(ඌ) මඤ්චපටිපාදක
(එ) කායබන්ධන
(ඒ) දන්තකට්ඨ
(ඔ) මත්තිකා
(ඕ) අග්ගිසාලා

(iii) පහත ගාථාවෙන් ප්‍රකාශිත ධර්ම කරුණු පිළිබඳ කෙටි විවරණයක් කරන්න.

පටිසම්භිදා චතස්සො ච, විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා, කතං බුද්ධස්ස සාසනං.

(iv) වර්තමාන භික්ෂු සමාජයේ අර්බුද හා අභියෝග වටහාගැනීම සඳහා මහාසුපින ජාතකයෙහි එන සිහින විවරණය උපයෝගී වන ආකාරය නිදසුන් තුනක්වත් ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 5+5+5+5 =20)

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank